වාහන කිහිපයක් ධාවනය කරන ව්‍යාපාරික ආයතන සඳහා තම සියලු වාහනවලට ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය යොදාගනිමින් QR ඉන්ධන අවසරපත්‍ර ලබාගැනීමේ විකල්ප අවස්ථාවක් ඉදිරියේදී ලබාදීමට නියමිත බව විදුලිබල හා බලශක්ති අමාත්‍ය කංචන විජේසේකර පවසනවා.

ඒ අවස්ථාව ලබාදීම සඳහා ජාතික ඉන්ධන අවසරපත්‍ර ක්‍රමවේදය ඉදිරි දින කිහිපය තුළ වැඩිදියුණු කරන බවයි Twitter පණිවිඩයක් නිකුත් කරමින් අමාත්‍යවරයා පෙන්වා දෙන්නේ.

මේ අතර ජාතික ඉන්ධන අවසරපත්‍ර ක්‍රමවේදය රජයට කිසිදු වියදමකින් තොරව, මෙරට ප්‍රමුඛ පෙළේ තාක්ෂණික සමාගම්වල දායකත්වයෙන් සහ ICTA ආයතනයේ මෙහෙයවීමෙන් නිර්මාණය වූවක් බවද අමාත්‍යවරයා සඳහන් කරනවා.

ආරම්භයේදී එහි යම් ගැටළු මතු විය හැකි නමුත් ඉදිරි දින කිහිපය තුළ සියලුදෙනාට QR ඉන්ධන අවසරපත්‍ර ලබාගැනීමට හැකියාව ලැබෙනු ඇති බවද අමාත්‍යවරයා වැඩිදුරටත් සඳහන් කරනවා.



**Kanchana Wijesekera**

@kanchana_wij

...

Update - National Fuel Pass will be upgraded in the next few days to give an option for Businesses\Organizations that operate multiple vehicles to register All their vehicles with the Business Registration Number. Each vehicle will be given a specific QR code after verification.